පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 492

ආයතනයේ නම : අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வினா இலக்கம் 492

நிறுவனத்தின் பெயர்: கல்வி வெளியீட்டுத் திணைக்களம்

பாராளுமன்றத்தில் அரச கணக்குகள் தொடர்பான செயற்குழுவினால் சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள் தொடர்பில் நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரது அவதானிப்புக்கள் மற்றும் எடுக்கப்பட்ட நடவடிக்கைகள் குறித்த விபரங்களை பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No : 492

Name of the institution : Education Publication Department

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No .119(4)

Scanned with CamScanner

ආකෘති අංක 01

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාවේ අංකය - 492

ආයතනයේ නම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

| අනු අංකය | පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 492 වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩු පාඩු | ආයතනය විසින් අඩු පාඩු නිවැරදි කරගැනීම සඳහා ගනු ලැබූ පියවරයන්ට අදාළ වර්තමාන තත්ත්වය |
|---|---|---|
| 01 | 2022.12.13 දිනැති අංක 2022/05 දරණ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශයේ 8.1 හා 8.2 ඡේද ප්‍රකාරව සිගාස් වැඩසටහනේ ස්ථාවර වත්කම් මොඩියුලය යාවත්කාලීනව පවත්වා නොතිබීම. | ස්ථාවර වත්කම් මොඩියුලය යාවත්කාලීන කිරීමට කටයුතු කරමින් පවතී. |
| 02 | හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබීම. | 2024 වර්ෂයේ සිට හානි පාඩු ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලබයි. |
| 03 | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කර නොතිබීම. | 2023 වර්ෂයට අදාළ දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කර ඇත්තේ ආයතනයේ ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය මත පමණක්වන අතර, 2024 වර්ෂයේ සිට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය සහිතව සකස්කිරීමට කටයුතුකර ඇත. |
| 04 | 2020.08.28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මු.රෙ. 756 (6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබීම. | මේ වන විට අදාළ කටයුතු අවසන් කර ඇත. |

Scanned with CamScanner

| | | |
|---|---|---|
| 05 | සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොතිබීම. | දෙපාර්තමේන්තුවේ භාවිතා කරනු ලබන සියලුම වාහනවල අයිතිය පවරා ගෙන ඇත. |
| 06 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබීම. | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් නිසි පරිදි විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලැබේ. |
| 07 | සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබීම. | රාජ්‍ය ලාංඡනය ස්ථිර ලෙස වාහනවල පින්තාරු කිරීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී. |
| 08 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂය සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබීම. | ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර ඇත. |
| 09 | වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතීම. | වර්තමානයේ එවැනි ශේෂ නොමැත. |
| 10 | ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබීම. | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණික දැනුමැති මාණ්ඩලික නිලධාරියෙකු නොමැතිවීම හේතුවෙන් නව වෙබ් අඩවියක් නිර්මාණය කිරීමේ කටයුතු ප්‍රමාද විය. වර්තමානයේ දී දෙපාර්තමේන්තුවේ නව වෙබ් අඩවිය සකස්කිරීම ගුවන් හමුදාව විසින් ආරම්භ කර ඇත. |
| 11 | ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබීම. | නිර්මාණය කරමින් පවතින නව වෙබ් අඩවියේ මහජනයා හට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී ඇත. |
| 12 | 2018.01.24 දිනැති අංක 05/2018 (1) දරණ චක්‍රලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි | 2008.02.06 දිනැති අංක 05/2008 දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛ ප්‍රකාරව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය නිසි |

Scanned with CamScanner

| | | |
|---|---|---|
| | පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබීම. | පරිදි පිළියෙල කර ඇත. එහෙත් එම ප්‍රඥප්තියට අනුකූලව දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සිදු වුව ද නියමිත කාලරාමුව තුළ අදාළ කාර්යයන් ඉටු කර ගැනීමට අපොහොසත් වී ඇත. ඉදිරි වසර තුල අදාළ කටයුතු නිසි පරිදි ඉටුකරගැනීමට කටයුතු කරනු ලැබේ. |
| 13 | ආයතනයේ පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මකවීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබීම. | ආයතනයේ පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මකවීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර ඇති නමුත්, ඊට අදාළ අධීක්ෂණ කටයුතු නිසිපරිදි ක්‍රියාත්මක වී නොමැත. ඉදිරි වසර තුළ සකස්කරන ලද ක්‍රමවේදය අනුව කටයුතු සිදුකරනු ලැබේ. |
| 14 | සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබීම. | සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්යසාධන ගිවිසුම් සකස් කර ඇත. |
| 15 | සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතීම. | 2025 වසරේ සැලසුම්ගත පුහුණු පාඨමාලා පවත්වා ඇත. |
| 16 | ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ/ අහිතකර මට්ටමේ වීම. | 2024 වර්ෂයේ විගණන මතය තත්වාගණනය කළ මතය ලෙස දක්වා ඇත. |
| 17 | විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබීම. | විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| 18 | සියලුම නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබීම. | සියලු නිලධාරීන් මේ වන විට වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇත. |

පී.ඒ. ශුභාශිණී දෙමටගොඩ
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය, බත්තරමුල්ල

Scanned with CamScanner